# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.01 පැය 1555 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/04 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**විශේෂ රථවාහන මෙහෙයුම සම්බන්ධව - පොලිස් මූලස්ථානය.**

උත්සව සමයේ රථවාහන අනතුරු අවම කර ගැනීමේ අරමුණින් වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි විශේෂ රථවාහන මෙහෙයුමක් 2024.12.23 වන දින සිට දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කර ඇත.

2024.12.31 වන දින පැය 0600 සිට 2025.01.01 වන අද දින පැය 0600 න් අවසන් වූ පැය 24 ක කාලය තුල විශේෂ රථවාහන මෙහෙයුම මඟින් බීමත් රියදුරන් 529 දෙනෙකු, අපරීක්ෂාකාරී හා අන්තරාදායක ලෙස රිය පැදවීමට අදාල රියදුරන් 57 දෙනෙකු, අධික වේගයෙන් රිය පැදවීම සම්බන්ධව රියදුරන් 54 දෙනෙකු, මාර්ග නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් රියදුරන් 1057 ක්, බලපත්‍ර වැරදි සම්බන්ධ රියදුරන් 614 ක් සහ වෙනත් රථවාහන වැරදි සම්බන්ධයෙන් රියදුරන් 4953 ක් වශයෙන් සමස්ත රථවාහන වැරදි සම්බන්ධයෙන් රියදුරන් 7264 ක් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කර ඇත.

ඉහත අත්අඩංගුවට ගන්නා ලද බීමත් රියදුරන් 529 දෙනා මෙම මෙහෙයුම ආරම්භ කිරීමෙන් පසු පැය 24 ක් තුල අත්අඩංගුවට ගත් වැඩිම සංඛ්‍යාව වේ.

මෙම විශේෂ මෙහෙයුම තවදුරටත් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන අතර බීමත්ව රිය ධාවනය නොකිරීමටත්, මාර්ග නීති උල්ලංඝණය ඇතුළු අනෙකුත් රථවාහන නීති රීති උල්ලංඝණය නොකරන ලෙසටත් ශ්‍රී ලංකා පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**